චක්‍රලේඛ අංක:- 05/2011

මගේ අංකය-කේ.01/2,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2011-02-02 වන දින

සියලුම බන්ධනාගාර අධිකාරීන් හා
සහකාර අධිකාරීන් වෙත.

## 63 වෙනි නිදහස් දින සැමරුම වෙනුවෙන් විශේෂ රාජ්‍ය සමාව - 2011-02-04

2011-02-04 වෙනි දිනට යෙදෙන 63 වෙනි නිදහස් දින සැමරුම වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පහත දැක්වෙන පරිදි බන්ධනාගාර දඬුවම් නියමකර ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රදානය කර ඇත.

01. 2011-02-04 දින වනවිට බන්ධනාගාර ගතව සිරදඬුවම් විඳිමින් සිටින සියලුම සිරකරුවන්ට ගෙවන ලද (ගතකරන ලද) වසරකට හෝ ඉන් කොටසකට සතියක් බැගින් (දින 07 ක) සමාවක් ලබාදීම.

02. දඩමුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතකරන ලද අදාළ සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් විඳින සිරකරුවන්ට ඉහත සඳහන් අංක 01, 02 යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ.

| | වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|---|
| I. | නීති විරෝධී රුස්වීම් | 140 සිට 142 සහ 146 |
| II. | මංකොල්ල | 380, 382 සහ 383 |
| III. | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431,432,440,44 ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| IV. | රාජ්‍ය ද්‍රෝහි ක්‍රියා | 114 - 123 |
| V. | පැහැරගෙන යාම් | 354 - 360 |
| VI. | අසභ්‍ය ප්‍රකාශන, ළමුනට අදාළ ප්‍රදර්ශනය | 286 A |
| VII. | ළමුනට හිංසා කිරීම | 308 A |
| VIII. | ණය බැඳුම්කරයකට හෝ දාස භාවයට පත්කිරීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම | 358 A |
| IX. | කුට්ටනය | 360 A |
| X. | ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජනය ගැනීම | 360 B |

| | | |
|---|---|---|
| XI. | තැනැත්තන් වෙළදාම් කිරීම | 360 C |
| XII. | ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 360 E |
| XIII. | දූෂණය කිරීම | 364 |
| XIV. | ව්‍යාභිචාරය | 364 A |
| XV. | අස්වාභාවික (ලිංගික) වැරදි | 365 |
| XVI. | පුද්ගලයින් අතර ඇඩි අශිෂ්ට ක්‍රියා | 365 A |
| XVII. | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |
| XVIII. | අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වූවත් | |
| XIX. | 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි | |
| XX. | ගිනි අවි ආඥා පනත යටතේ වැරදි | |
| XXI. | 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි | |
| XXII. | 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි | |
| XXIII. | වස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත | |
| XXIV. | හදිසි නීතිය යටතේ වැරදිකරුවන් වූවත් | |
| XXV. | ආදායම් බදු නඩු වල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඬුවම් විඳින්නවුන් | |
| XXVI. | රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වූවත් | |
| XXVII. | ඉහත අංක 01 සිට xxvi යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධහමුදා පනත,නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය | |

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2011-02-04 වන දින වනවිට බන්ධනාගාර ගතව සිරදඬුවම් විඳිමින් සිටින සිරකරුවන් කෙරෙහි පමණි. මුදාහැරීම ක්‍රියාත්මක කල යුතු දිනය 2011-02-04 දින වේ.

එක් සිරකරුවෙකුට ඉහත සඳහන් විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදා හරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව 2011-02-03 දින ප:ව: 2.00 ට පෙර දුරකතන පණිවුඩයක් මගින් හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් දැනුම්දී නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කරන්න

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.